**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**
**කර්මාන්ත හා ව්‍යවසායකත්ව හා සංවර්ධන අමාත්‍යාංශය**
**තනතුරු පුරප්පාඩු**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රීලාංකික පුරවැසියන් අතුරින් සුදුසුකම්ලත් හා අත්දැකීම් සහිත අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. <u>අධ්‍යක්ෂ (මූල්‍ය) (HM 1-1) - තනතුරු 01</u>

<u>**රැකියා විස්තරය :**</u>

මූල්‍ය අංශයේ සමස්ථ පරිපාලනය, ප්‍රතිපත්ති සකස් කිරිම, කාර්යාල මාර්ගෝපදේශ සහ මූල්‍ය සැලසුම් කරණය, පාලනය සඳහා අයවැයකරණය, ගිණුම්කරණය, පිරිවැය සහ මූල්‍ය වාර්තාකරණය, ණය සහ එකතුකිරිම්, බැංකුකරණය, මුදල් කළමනාකරණය, විගණන සහ ආරක්ෂණය පිළිබඳ කළමණාකරණයට තොරතුරු සැපයීම, අරමුදල් වැඩි දියුණුකිරිම සහ අධීක්ෂණය කිරිම, ආයතනික අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය හා ගිණුම්කරණය වාර්තා සකස්කිරිම, මූල්‍ය හා ක්‍රියාකාරි සැලැස්ම ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය ගිණුම්කරණ සේවා සැපයීම සහ අධිකාරියේ විගණන හා කළමණාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මූල්‍ය හා අරමුදල් තත්ත්ව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරිමේ වගකීම, ඔහු හෝ ඇය සතු වගකීමකි.

<u>**බාහිර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් හා පළපුරුද්ද:**</u>

අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) සාමාජිකත්වය හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකත්වය (CIMA) සහ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි සාමාජිකත්වය ලබා තිබීම. (ACCA)

හෝ

ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය/ ආර්ථික විද්‍යාව පිලිබඳ මූලික උපාධිය සහ කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 15ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් හා පළපුරුද්ද:**</u>

අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) සාමාජිකත්වය හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකත්වය (CIMA) සහ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි සාමාජිකත්වය ලබා තිබීම. (ACCA)

හෝ

ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය/ ආර්ථික විද්‍යාව පිලිබඳ මූලික උපාධිය සහ කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඇ) I ශ්‍රේණියේ කළමනාකරණ කාණ්ඩයේ අවම වශයෙන් අවුරුදු පහක (5) සතුටුදායක සේවා කාලයක් තිබීම.( MM 1-1)

<u>**වැටුප් පරිමාණය**</u>

HM 1-1 - රු. 140,640 – 4,100 X 15 – 202,140 + රජයේ අනුමත දීමනා හිමි වේ.

*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

<u>**අතිරේක ප්‍රතිලාභ**</u>

- PED චක්‍රලේඛ අංක 01/2015 යටතේ නිල ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ඇත.
- වෘත්තීය දීමනාව
- දුරකතන දීමනාව

වයස :
අවුරුදු 35 ට නොඅඩු සහ 50 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර)

**02. සහකාර අධ්‍යක්ෂ (මෙහෙයවීම්) (MM 1-1) තනතුරු 01**

**රැකියා විස්තරය :**

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සම්බන්ධයෙන් නිෂ්පාදන සංවර්ධන වැඩ සටහන් සකස් කිරීම, ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම, සැපයුම් සංවර්ධනය , තාක්ෂණික සංවර්ධනය, තත්ත්වය වැඩි දියුණු කිරීම, අගය එකතු කිරීම, නිෂ්පාදන සංවර්ධනය ආරම්භ කිරීම සහ මැණික් සහ ස්වර්ණාභරණ නිෂ්පාදන දේශීය හා අපනයන වෙළෙඳපලට අනුවර්තන කිරීම ඇතුලු ඒකාබද්ධ වැඩ සටහන් හරහා තෝරාගත් කාර්මික උපකරණ හා සේවා (වෘත්තීය) සංවර්ධන කාර්ය සාධකය වැඩි දියුණු කිරීම සහ අංශයේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂකවරයාට සහය වීම.

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද:**

අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / වාණිජ්‍ය /සංඛ්‍යානය පිලිබඳ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 03 ක පළපුරුද්ද.

ආ) පළමු හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය හිමි වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා - සුදුසුකම් හා පළපුරුද්ද:**

අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ සංඛ්‍යාලේඛන පිළිබඳ උපාධියක් සහ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ සංඛ්‍යාන නිලධාරියෙකු හෝ පරිගණක ජාල පරිපාලන නිලධාරියෙකු ලෙස වසර 03 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (5) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කිරීමට හැකිවීම අත්‍යාවශ්‍යයි.

වැටුප් පරිමාණය
MM 1-1 - රු. 91,690 – 2,480 X 10 – 3,450 X 15 – 168,240 + රජයේ අනුමත දීමනා හිමි වේ.
*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

අතිරේක ප්‍රතිලාභ
- වෘත්තීය දීමනාව
- දුරකතන දීමනාව

වයස :

අවුරුදු 22 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) .

අතිරේක ප්‍රතිලාභ

- සේවක අර්ථසාධක / භාරකාරත්ව අරමුදලේ හිමිකම
- වාර්ෂික ලාභ මත ගෙවනු ලබන දිරි දීමනා
- සේවකයා සහ ඔහු / ඇයගේ පවුලේ අය සඳහා වෛද්‍යාධාර ප්‍රතිපූර්ණය
- ප්‍රවාහන දීමනා
- ත්‍යාග දීමනා
- නිවාස ණය පොලී සහ වෙනත් ණය පහසුකම්

ඉහත සියලු තනතුරු සඳහා අයදුම් කරන පුරවැසියන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබාගත හැකි ඥාතී නොවන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක අයදුම්පත්‍රයට ඇතුලත් කොට තම වෘත්තීය සහ අධ්‍යාපන සහතික සහ සේවා සහතිකවල, **සහතික කරන ලද පිටපත්ද සමඟ සිය අයදුම්පත** **2026.09.21** දින හෝ එදිනට පෙර අයදුම්කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ ඉහල වම් කෙලවරෙහි සඳහන් කර **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි** වෙත පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානින් මඟින් එවිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.


**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**<br>
**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,**<br>
**අංක 260, RTFC & WMC ගොඩනැගිල්ල,ලේක් ඩ්‍රයිව්, කොළඹ 05.**<br>
**දුරකතන අංක - 011-2390645 – 011 -2390646**<br>
**ෆැක්ස් - 011-2320758**